
# කවිනිගේ නියම



කවිනි නිහින්සා මෙනන්

# කවිනිගේ නියම

කවිනි නිහින්සා මෙනන්

වෙනත් කෘති

- මගේ යාළු මාළුවා නැතිවුණ හැටි
- මගේ අරුම පුදුම දත් දෙක
- Ginger the cat

2025 February 08
ISBN 978-624-208-206-6

# පිදුම

මට හැමදාම ආදරය කරන අම්මා, තාත්තා, අක්කා ඇතුළු පවුලේ සැමටත්, මගේ සියලුම යහළුවන්ටත්, මට ලස්සනට සිංහල අකුරු ලියන්න කියවන්න කියාදුන්න වාසනා ගුරු මෑණියන්ටත්, මට ඉගැන්වූ සියලුම ගුරු මෑණිවරුන්ට සහ පියවරුන්ටත් මගේ මෙම නිර්මාණය වන " **කවිනිගේ නියම** " කතාව බැති සිතින් පුදමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාල පරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත්කතුවරියන් සමත් වීම සුවිශේෂී සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදී කතෘ කරුදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුල යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද ග්‍රන්ථකරණයට යොමු කරන ''හෙරණගත්කරණී'' ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක්ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය

ශශිකලා සේනාධීර

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

# 01 නියමය

බෙහෙත් පෙත්තක් බොන්නේ කොහොමද?

මම බෙහෙත් බොනකොට තේරුන දෙයක් තමයි බෙහෙත් පෙත්තක් ගිලිනකොට ඒක තියාගන්න ඕන දිවේ ඉස්සරහ කෙළවර. එතකොට ගිලින්නත් ලේසියි. තිත්තත් අඩුයි.




1 නියමය
2
1

# 02 නියමය

සාරි පොටේ ප්‍රයෝජන

සාරි පොට තියෙන්නේ ඇඳුමේ ලස්සනට විතරක් නෙමෙයි. සීතල කාලෙට සාරි පොට බෙල්ලේ ඔතාගත්තම සීතල අඩුවෙනවා. රස්නෙ කාලෙට සාරි පොට අවානක් විදිහට පාවිච්චි කරන්නත් පුළුවන්. මම මේක හොයාගත්තේ අපේ පන්ති භාර ගුරුතුමියගෙන්.





# 03 නියමය

නානකොට වතුර සීතල ද?

නානකොට මුලින්ම එන වතුර හරිම සීතලයි. හරියට අයිස් කැටයක් වගේ. ටිකක් වෙලා යනකොට වතුර ටිකක් රස්නෙ වෙනවා. එතකොට අත්දෙකට වතුර රස්නෙ වුණාම ඇඟට තාම සීතලයි. මුළු ඇඟටම රස්නේ දැනෙන්න ටිකක් වෙලා යනවී


නියමයි

# 04 නියමය

හෙම්බිරිස්සාව තියෙනකොට හුස්ම ගන්න අමාරුද?

හෙම්බිරිස්සාව තියෙන කොට, කටේ කෑම පුරවාගත්තොත් හුස්ම ගන්න තවත් අමාරු වෙනවා. ඒක මටම දැනිච්ච දෙයක්






# 05 නියමය

කෑමවල මිරිස් සැර

මම මේ දේ හොයාගත්තේ අත්තම්මා උයපු මාළු හොද්ද කනකොට තමයි. අපි සැර දෙයක් කාලා උණු වතුර බොනකොට සැර තවත් වැඩි වෙනවා. සීතල වතුර බොනකොට ඒ සැර අඩු වෙනවා.




5 නියමයි

# 06 නියමය

**Table Tennis** (මේස පන්දු) බෝලය

මේ පුදුම දේ මම දැනගත්තේ පාසලේ මේස පන්දු පුහුණුවීම් කරනකොටයි. බෝලයකට අපි මොකෙන් හරි ගැහුවොත් ඒක නිකන් ඉරක් දිගේ යන්නේ නැහැ. බෝලෙත් කැරකි කැරකි තමයි ඉස්සරහට යන්නේ. බලන්නකෝ වැඩේ.




6 නියමය

# 07 නියමය

කොණ්ඩය සහ ඇස්දෙක මොන පාටද?

අපිට එක පාරම බලනකොට අපේ කොණ්ඩයයි ඇස් දෙකයි පේන්නේ මොන පාටින්ද? කළු පාටින් නේද? නැහැ යාළුවනේ ඒ දෙකේම පොඩි දුඹුරු පාටක් මිශ්‍ර වෙලා තියෙනවා. ඒක මම හොයා ගත්තේ පොඩ්ඩක් වෙලා අව්වේ හිටගෙන ඉන්නකොට.




## 08 නියමය

විදුලි බල්බයක් පත්තු වෙන්නේ කොහොමද?

මම මෙච්චර කල් හිතුවේ විදුලි බල්බය පත්තු වෙන්නේ ස්විච් එකක් දැම්මම කියලා. ඒත් අපේ තාත්තා ගෙනාපු ලස්සන විදුලි බල්බයක් පත්තු කරන්න ස්විච් එකක් තිබුණේ නැහැ. තිබුණේ කාන්දමක්. ඔව්... ඔව්... කාන්දමක් පාවිච්චි කරලත් විදුලි බල්බයක් පත්තු කරන්න ක්‍රමයක් හදාගන්න පුළුවන්. ඒ ගැන මම ටිකක් හොයන්න ඕනෑ.




නියමය

## 09 නියමය

පැළයක පත්‍ර එකම පාටද?

පැළවල පත්‍ර කොළ පාට විතරද? කොළ පාට පත්‍රයක දුඹුරු පාට, කහ පාට වගේ පාට තියෙන්න පුළුවන්ද? ඔව් කොළ පාට පත්‍රයක දුඹුරු පාට කහ පාට වගේ පුල්ලි තියෙන්න පුළුවන්. මම දැනගත්ත විදිහට සමහර පැළවලට අව්ව වැටෙන විදිහට ඒවායේ කොළ පාට තියෙන තැන් සහ ප්‍රමාණ වෙනස් වෙන්න පුළුවන්ලු.




නිමි



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විහවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවක් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශිය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදී ශිෂ්‍යාවන් දැක් වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටළු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගලපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩ නගා දී තිබේ. තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මාගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක

සෙනෙවිරත්න මහලේකම්